<u>**11 ශ්‍රේණිය**</u>

<u>**88 පාඩම - කුරහන් ඉසිමුව කළුවර බලාලා**</u>

<u>**භාෂාත්මක ලක්ෂණ**</u>

01). ජන කවිය අයත් වන සාහිත්‍යාංගය කුමක් ද?

02). කෘෂි කර්මාන්තය ආශ්‍රිතව නිර්මාණය වූ ජනකවි වර්ග 3 ක් නම් කරන්න.

03). ''නිල්ල අඹති, කණු මදු' යන වචනවල අර්ථයක් ලියන්න.

04). ජන කවියේ භාෂාත්මක ලක්ෂණ ''කුරහන් ඉසිමුව කළුවර බලලා ' ජන කවි ඇසුරින් විස්තර කරන්න.

<u>**11 ශ්‍රේණිය**</u>

<u>**89 පාඩම - ශෝකයත් රසයක් කළ මිනිසෙක්**</u>

**නිපුණතාව** :- **10.0 සාහිත්‍යයික, දාර්ශනික විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශිලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.**

**නි.ම.** :- **සාහිත්‍යයික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.**

1. විලයම් ශේක්ස්පියර්ගේ ළමා කාලය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
2. සුප්‍රකට ඉංග්‍රිසි සාහිත්‍යධරයෙකු වන ආචාර්ය ජී.බී. හැරිසන් **"ශේක්ස්පියර් හැඳින්වීම කෘතියෙහි"** ඔහු පිළිබඳ විස්තර කර ඇත්තේ කෙසේ ද?
3. ඔහු විසින් ලියා ඇති නාට්‍ය කෘති ගණන සහ ඒවාට පදනම් වුයේ මොනවාදැයි ලියන්න.
4. සාහිත්‍යවේදීහු ශේක්ස්පියර්ගේ නිර්මාණ ජීවිතයේ අවධි 4 ක් දක්වති. එම අවධි 4 ක් ලියන්න.
5. ඔහුගේ නිර්මාණයක් වූ වැනීසියේ වෙළෙන්දා කතාවේ සඳහන් සදාතනික කියමන් සොයා ලියන්න.

**ඉගෙනුම් ඵල** :-

- **විලියම් ශේක්ස්පියර්ගේ චරිත කතාව කියවයි.**
- **විලියම් ශේක්ස්පියර්ගේ චින්තනය පිළිබඳ අදහස් දක්වයි.**
- **විලියම් ශේක්ස්පියර්ගේ සේවය අගය කරයි.**
- **කියවීමෙන් ලද දැනුම උචිත පරිදි භාවිත කරයි.**